**පරීක්ෂණ පරිපාටිය :—**

සාමාන්‍ය ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණය සඳහා විෂයයක් වශයෙන් පැවැත්වෙන බෞද්ධ දර්ශනය පරීක්ෂණයට පහත දැක්වෙන අන්දමට පැය තුනේ ප්‍රශ්න පත්‍ර තුනක් ඇතුළත් වේ.

බෞද්ධ දර්ශනය I (බෞදසා 1): ආචාර විද්‍යාව හා මනෝවිද්‍යාව

බෞද්ධ දර්ශනය II (බෞදසා 2): දර්ශන ඉතිහාසය, තුලනය හා ව්‍යවහාරය.

බෞද්ධ දර්ශනය III (බෞදසා 3): පාරභෞතික විද්‍යාව හා ඥාන මීමාංසාව

**බෞද්ධ දර්ශනය I (බෞදසා 1): ආචාර විද්‍යාව හා මනෝවිද්‍යාව**

**ආචාර විද්‍යාව :**

බෞද්ධ ආචාර විද්‍යාවේ ස්වභාවය, පදනම හා අරමුණ; හොඳ නරක හරි වැරදි; චේතනාව හා සදාචාරය හේතුකරණය; ආත්මාර්ථය, පරාර්ථය හා ස්වාර්ථය; යුතුකම හා බැඳී සිටීම; නිදහස හා වගකීම; සදාචාර නීතිමාලාව-කින් සිදුවන අර්ථසිද්ධිය යන කරුණු පිළිබඳ සමාලෝචනයක් අපේක්ෂිතයි.

**මනෝවිද්‍යාව :**

බෞද්ධ මනෝවිද්‍යාවේ ස්වභාවය හා අරමුණ; විඥානය හා විඥාන ක්ෂේත්‍රයන්; විෂය විෂයි සම්බන්ධය; සංවේදනය, සංජානනය හා සංචේ-තනය; චිත්තවේග යනාදින් විඥානයේ අංග; විඥානයේ කෘත්‍යය හා ඉන්ද්‍රිය ක්‍රියාකාරිත්වය යන කරුණු පිළිබඳ සමාලෝචනයක් අපේක්ෂිතයි.

**බෞද්ධ දර්ශනය II (බෞදසා 2): දර්ශන ඉතිහාසය, තුලනය හා ව්‍යවහාරය**

**දර්ශන ඉතිහාසය :**

සම්බුද්ධ පරිනිර්වාණයේ පටන් නවවන සියවසේ අවසානය දක්වා බෞද්ධ දර්ශන ඉතිහාසය: ප්‍රධාන හීනයානික බෞද්ධ සම්ප්‍රදයයන් හා එකී සම්ප්‍රදයයන්ගෙන් වෙන වෙනම නියෝජනය වන දර්ශන වාදය; මහායානයේ ප්‍රභවය හා මහායාන සම්ප්‍රදයයන් පිළිබඳව සලකා ගතයුතු මූලධර්ම; තන්ත්‍රයානය යන කරුණු පිළිබඳව සමාලෝචනයක් අපේක්ෂිතයි.

**තුලනය හා ව්‍යවහාරය :**

බෞද්ධ දර්ශනය, අදාල පරිදි, ඉන්දීය දර්ශන සම්ප්‍රදයයන් සමගත්, යුරෝපීය දර්ශනවාද සමගත්, මනෝවිද්‍යාව යනාදි නවීන විද්‍යාවන් සමගත් තුලනය කිරීම හා සමාජ දර්ශනය, දේශපාලන දර්ශනය හා නීති මූලධර්ම විද්‍යාව අනුසාරයෙන් උපයුක්ත වන අයුරු පිළිබඳ සමාලෝචනයක් අපේක්ෂිතයි.

## බෞද්ධ දර්ශනය III (බෞදසා 3) පාර භෞතික විද්‍යාව හා ඥාන මීමාංසාව

### පාරභෞතික විද්‍යාව :

විශ්වයේ හා මිනිසාගේ ස්වභාවය; ඊශ්වර හා පරම සද්භාවය; ආදි බෞද්ධ දර්ශනයේ එන යථාර්ථවාදී, විඥානවාදී, අද්වයවාදී හා කේවල බහුත්වවාදී ප්‍රවණතා; පුද්ගල ස්වච්ඡන්දතාව හා නියතිවාදය; නිත්‍යත්වය හා විපරිනාමය; හේතුඵල වාදය; සිත හා භෞතික පදර්ථ; මරණය හා පුනර්භවය විඥානවාදී හා භෞතිකවාදී දර්ශන සම්ප්‍රදයයන් ගැන බෞද්ධ ආකල්පය; ප්‍රපඤ්චය හා නිෂ්ප්‍රපඤ්චය යන කරුණු පිළිබඳව සමාලෝචනයක් අපේක්ෂිතයි.

### ඥන මීමාංසාව :

අනුභූතිය හා එහි ස්වභාවය; අනුභූතියේ මූලාශ්‍රයයන්, මාධ්‍යයන් හා සීමාවන්; උපලබ්ධිය නොපිළිගත් දර්ශන සම්ප්‍රදයයන්; අනුභූතිය පිළිබ සංශවාදී මත; සංශය හා නියතතාව; ආප්තය පිළිබඳ බෞද්ධ ආකල්පය; විශ්ලේෂණය හා අර්ථය; භාෂාව, සත්‍යය හා තර්කනය; මතකය; ස්වප්න යන කරුණු පිළිබඳ සමාලෝචනයක් අපේක්ෂිතයි.

### උපදේශිත කියවීම් :—


A. K. WARDER — *Indian Buddhism*

BAPATH — 2500 *Years of Buddhism* (Ministry of Information & Broadcasting)

DUTT — *Early Monastic Buddhism*

SAMGHARAKSITA — *A Survey of Buddhism*

D. T. SUZUKI — *Outline of Mahayana Buddhism*

CONYE — *Buddhist Thought in India*

SARKAR — *Changing Phases of Buddhism* (Bharah Bhavan Patna)

P. KARASU — *The Essence of Buddhism*

K. MORGAN — *The Path of the Buddha*

BARUA — *Pre Buddhistic Indian Philosophy*

DAS GUPTA — *History of Indian Philosophy*

DEUSSEN — *Philosophy of Upanisadas*

MEHTA — *Early Indian Religious Thought*

PANDE — *Origins of Buddhism*

THOMAS — *The Life of the Buddha*

TACHIBANA — *The Ethics of Buddhism*

HARTMAN — *Ethics*

WALKER — *The Definition of Morality*

URBAN — *Fundamentals of Ethics*

H. TITUS — *Ethics for Today*

SPIRO — *Buddhism & Society*

JAYASURIYA — *Psychology of Buddhism*

P. DE SILVA — *Buddhist and Freudian Psychology* (Lake House)

N. DUTTA — *Principal Schools of Buddhism* (Calcutta C.O. Book Agency)

HACKMAN — *Buddhism as a Religion*

MRS. R. DAVIDS — *Outline of Buddhism*

PAUL CARUS — *The Gospel of Buddha*

T. H. STCHERBATSKY — *The Soul Theory of the Buddhists*

SUZUKI — *Lankavatara Sutra*

කලන්සූරිය — දර්ශනය ප්‍රත්‍යක්ෂය හා ඥානය

හිරිඅන්න — සංක්ෂිප්ත ඉන්දිය දර්ශනය (අධ්‍යාපන දෙපාර්තමේන්තුව)

රාධක්‍රිෂ්ණ — භාරතීය දර්ශන ඉතිහාසය (අධ්‍යාපන දෙපාර්තමේන්තුව)

හෂාම් — අසිරිමත් ඉන්දියාව (අධ්‍යාපන දෙපාර්තමේන්තුව)

කළුපහන — භාරතීය දර්ශන ඉතිහාසය (අධ්‍යාපන දෙපාර්තමේන්තුව)

රාහුල හිමි — බුදුන් වදළ ධර්මය (ගුණසේන)